කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2023

2025 - මැයි

**BCOME1025 - සූක්ෂම ආර්ථික විද්‍යාව**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : හතයි (07) කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්ණ අංක 01**

අ. i. සූක්ෂම ආර්ථික විද්‍යාව නිර්වචනය කර, ආර්ථිකයක ක්‍රියාකාරිත්වය සඳහා එහි වැදගත්කම පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**

ii. තරඟකාරී වෙළඳපොළක ඉල්ලුම් සහ සැපයුම් බලවේග විසින් සමතුලිත මිල තීරණය කරන ආකාරය පැහැදිලි කරන්න.

**(ලකුණු 04)**

ආ. නිෂ්පාදනයක් සඳහා ඉල්ලුම් සහ සැපයුම් ශ්‍රිත පහත පරිදි දක්වා ඇත:

ඉල්ලුම: $Qd = 100 - 2P$

සැපයුම: $Qs = 20 + 3P$

අවශ්‍ය වන්නේ,

i. සමතුලිත මිල සහ ප්‍රමාණය ගණනය කරන්න.

**(ලකුණු 04)**

ii. රජය $P = 10$ ට මිල සීමාවක් නියම කරන්නේ නම්, එහි බලපෑම මඟින් ඇති වන හිඟය හෝ අතිරික්තය ගණනය කරන්න.

**(ලකුණු 04)**

iii. වෙළඳපොල මිළ සීමාවක් මඟින් ඇති විය හැකි ප්‍රති පාකයක් පැහැදිලි කරන්න.

**(ලකුණු 03)**

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්ණ අංක 02**

අ. ඉල්ලුමේ මිල නම්‍යතාවය (PED) නිර්වචනය කර එයට බලපාන සාධක පැහැදිලි කරන්න.

**(ලකුණු 08)**

ආ. සමාගමක් තම නිෂ්පාදනය රු.50 කට අලෙවි කරයි. මිල රු.40 දක්වා අඩු කළ විට, ඉල්ලුම් ප්‍රමාණය ඒකක 1,000 සිට ඒකක 1,400 දක්වා වැඩි වේ.

අවශ්‍ය වන්නේ,

i. මධ්‍ය ලක්ෂ්‍ය ක්‍රමය භාවිතයෙන්, ඉල්ලුමේ මිල නම්‍යතාවය ගණනය කරන්න.

**(ලකුණු 03)**

ii. එහි ඉල්ලුම නම්‍ය, අනම්‍ය හෝ ඒකීය ද යන්න දක්වා, ඔබ ලබාගත් ප්‍රතිඵලය අර්ථ නිරූපණය කරන්න.

**(ලකුණු 03)**

ඇ. ඉල්ලුම් මිළ නම්‍යතාවය පිළිබඳ අවබෝධය ව්‍යාපාර සහ රජයන්ට වඩා යහපත් මිළකරණයක් සහ ප්‍රතිපත්ති තීරණ ගැනීමට උපකාරී වන ආකාරය පැහැදිලි කරන්න.

**(ලකුණු 06)**
**(මුළු ලකුණු 20)**

ප්‍රශ්ණ අංක 03

අ. i. මුළු උපයෝගිතාවය සහ ආන්තික උපයෝගිතාවය අතර වෙනස පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**

ii. අයවැය සීමාවන්, පාරිභෝගික තීරණ වලට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**

ආ. පාරිභෝගිකයෙකුට රු.360 ක අයවැයක් ඇත. ඔහු විසින් එය, නිෂ්පාදන A සහ නිෂ්පාදන B අතර වෙන් කරන්නේ කෙසේදැයි තීරණය කළ යුතුව ඇත.

A නිෂ්පාදිතයේ මිල = රු. 60

B නිෂ්පාදිතයේ මිල = රු. 30

එක් එක් ඒකකයේ ආන්තික උපයෝගීතාව (MU) පහත දක්වා ඇත:

| ඒකක | A ආන්තික උපයෝගීතාව $(MU)_A$ | B ආන්තික උපයෝගීතාව $(MU)_B$ |
|---|---|---|
| 1 | 30 | 18 |
| 2 | 24 | 15 |
| 3 | 18 | 12 |
| 4 | 12 | 9 |
| 5 | 6 | 6 |

අවශ්‍ය වන්නේ,

i. A සහ B හි සෑම ඒකකයක් සඳහාම ආන්තික උපයෝගිතාව ගණනය කරන්න.

**(ලකුණු 03)**

ii. උපයෝගිතා උපරිම කිරීම සඳහා මෙම පාරිභෝගිකයා විසින් එක් එක් භාණ්ඩයෙන් ඒකක කොපමණ ප්‍රමාණයක් මිලදී ගත යුතුද?

**(ලකුණු 03)**

iii. සමාන ආන්තික මූලධර්මය සත්‍යාපනය කිරීමෙන් පාරිභෝගිකයා උපයෝගීතාව උපරිම කරන බව පෙන්වන්න.

**(ලකුණු 04)**

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්ණ අංක 04

අ. ප්‍රාග්ධනය ස්ථාවර වන තත්වයක් තුළ, කෙටි කාලීනව භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා සමාගමක් සේවකයින් බඳවා ගනී. පහත වගුව මඟින්, ශ්‍රමයේ මුළු නිෂ්පදිතය පෙන්වයි.

| ශ්‍රම ඒකක (L) | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|---|
| මුළු නිෂ්පාදිතය (TP) | 15 | 40 | 70 | 95 | 110 | 120 | 125 |

අවශ්‍ය වන්නේ,

i. සෑම ශ්‍රම ඒකකයක් සඳහාම, ආන්තික නිෂ්පාදිතය (MP) සහ සාමාන්‍ය නිෂ්පාදිතය (AP) ගණනය කරන්න.

**(ලකුණු 04)**

ii. ගණනය කළ අගයන් භාවිතා කරමින්, වැඩිවන අඩුවන සහ සෘණ ආන්තික ප්‍රතිලාභ අතර වෙනස පැහැදිලි කරන්න.

**(ලකුණු 04)**

iii. මුළු නිෂ්පාදිතය (TP) ,සාමාන්‍ය නිෂ්පාදිතය (AP) හා ආන්තික නිෂ්පාදිතය (MP) වක්‍ර එකම ප්‍රස්ථාර සටහනක ඇඳ ඒවායේ සම්බන්ධතා පැහැදිලි කරන්න.

**(ලකුණු 04)**

ආ. i. නිෂ්පාදන ශ්‍රිතය මඟින් අදහස් කරන්නේ කුමක්ද?

**(ලකුණු 03)**

ii. සම නිශ්පාදන වක්‍ර හා සම පිරිවැය වක්‍ර භාවිතා කරමින් සමාගමක් විසින් යෙදවුම්වල ප්‍රශස්ත සංයෝජනය තීරණය කරන්නේ කෙසේද? නිෂ්පාදන සැකසුමක ප්‍රායෝගික උදාහරණයක් සමඟ පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්ණ අංක 05

අ. සමාගමක් තරඟකාරී වෙළඳපොළක ක්‍රියාත්මක වන අතර එහි පිරිවැය ව්‍යුහය විශ්ලේෂණය කරයි. සමාගම ශ්‍රමය සහ ප්‍රාග්ධනය යන සාධක දෙකම භාවිතා කරමින් තම නිෂ්පාදනයන් සිදු කරයි, එහිදී ශ්‍රමය විචල්‍ය වන අතර කෙටි කාලීනව ප්‍රාග්ධනය ස්ථාවර වේ. පහත දත්ත සමාගමේ පිරිවැය සහ නිමවුම තොරතුරු නියෝජනය කරයි:

| නිමවුම (Q) | 0 | 100 | 200 | 300 | 400 | 500 |
|---|---|---|---|---|---|---|
| මුළු ස්ථාවර පිරිවැය (TFC) | 1000 | 1000 | 1000 | 1000 | 1000 | 1000 |
| මුළු විචල්‍ය පිරිවැය (TVC) | 0 | 2000 | 3000 | 4500 | 6000 | 8500 |

අවශ්‍ය වන්නේ,

i. එක් එක් නිමැවුම් මට්ටම සඳහා, පහත සඳහන් දෑ ගණනය කරන්න:

a. මුළු පිරිවැය (TC)

b. සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC)

c. ආන්තික පිරිවැය (MC)

**(ලකුණු 06)**

ii. දී ඇති පිරිවැය ව්‍යුහය මත පදනම්ව, සමාගමේ පිරිවැය හැසිරීම විශ්ලේෂණය කර ආන්තික පිරිවැය (MC) සහ සාමාන්‍ය මුළු පිරිවැය (ATC) අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

**(ලකුණු 07)**

ආ. "සමාගම් සැමවිටම ලාභය උපරිම කිරීම අරමුණු නොකරයි". කෙටි කාලයේදී සහ දිගු කාලයේදී සමාගමකට අනුගමනය කළ හැකි විකල්ප අරමුණු සාකච්ඡා කරන්න. උදාහරණ සමඟ ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

**(ලකුණු 07)**
**(මුළු ලකුණු 20)**

ප්‍රශ්ණ අංක 06

අ.. පූර්ණ තරඟකාරිත්වය යටතේ ක්‍රියාත්මක වන ආයතනයන් කෙටි කාලයේදී සහ දිගු කාලයේදී, එහි මිල , නිමවුම සහ ලාභය තීරණය කරන්නේ කෙසේද? නම් කරන ලද රූප සටහන් සහ සත්‍ය උදාහරණ සමඟ ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

**(ලකුණු 08)**

ආ. පූර්ණ තරඟය සහ කතිපයාධිකාරය යන වෙළඳපල ව්‍යුහයන් සංසන්දනය කරන්න.

**(ලකුණු 06)**

ඇ. "කතිපයාධිකාරී වෙළඳපොළක, සමාගම් බොහෝ විට වෙළඳපල කොටස වැඩිකර ගැනීම සඳහා මිල නොවන තරඟයක නිරත වේ". ප්‍රායෝගික උදාහරණ භාවිතා කරමින්, මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

**(ලකුණු 06)**

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්ණ අංක 07**

අ.. සමාගම් ගණන, නිෂ්පාදන විවිධාංගිකරණය, මිලකරණ බලය සහ ප්‍රවේශ බාධක යන සාධක පදනම් කරගනිමින්, ඒකාධිකාරී සහ ඒකාධිකාරී තරඟයේ වෙළඳපල ව්‍යුහයන් සංසන්දනය කරන්න.

**(ලකුණු 07)**

ආ. ආන්තික ආදායම (MR) = ආන්තික පිරිවැය (MC) රීතිය භාවිතයෙන් ඒකාධිකාරියක් ලාභ උපරිම කරන මිල සහ නිමවුම තීරණය කරන ආකාරය පැහැදිලි කරන්න. රූප සටහනකින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

**(ලකුණු 07)**

ඇ. ඒකාධිකාරී තරඟයේ නියුතු සමාගමක් කෙටි කාලීනව සහ දිගු කාලීනව එහි ලාභ උපරිම කරන මිල සහ නිමවුම තීරණය කරන්නේ කෙසේද? රූප සටහන් ආධාරයෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 06)**

**(මුළු ලකුණු 20)**